- විජේසිංහ, රත්න ශ්‍රී, **ඉරබටු තරුව**, ගොඩගේ, කොළඹ, 1998.
- විජේසිංහ, රත්න ශ්‍රී, **සුදු නෙළුම**, ගොඩගේ, කොළඹ, 1993.
- වීරසිංහ, සමන් චන්ද්‍රනාත්, **අපේ කාලේ සරස්වතී**, කොළඹ, 1990.
- සම්පත්, බිහේෂ්, **හද බැඳි පැදි**, ගාල්ල, 2009.
- සිද්ධාර්ථ හිමි, රඹුකන, **සංසාරේ අපි**, කොට්ටාව, 2005.
- සිද්ධාර්ථ හිමි, රඹුකන, **සසර දනව්ව**, කොට්ටාව, 2006.
- හේරත්, සමන්ත, **සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය**, ගොඩගේ, කොළඹ, 1995.
- හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, **අජන්තා ගීතාවලී**, ගොඩගේ, කොළඹ, 2002.


# වේදය


## පූජ්‍ය උඩවෙල රේවත හිමි



There are four Vedas which are the sacred texts of Hinduism such as the Rig Veda, Sama Veda, Yajur Veda and Atharva Veda. Scholars have determined that the Rig Veda, the oldest of the four Vedas, was composed about 1500 B.C., and compiled about 600 B.C. Besides its spiritual value, it also gives a unique view of everyday life in India four thousand years ago. The rigveda is also the most ancient extensive text in an Indo-European language and invaluable source in the study of comparative linguistics. The book is organized in ten texts known as mandalas of varying age and qualities. From two to seven sections are said to be "family books" that are considered the oldest and shortest components of Rigveda. The first & the Tenth Mandalas are the youngest and the longest texts. Each mandala consists of hymns called Sukta. Within each mandala the hymns are collocated in collections each dealing with a particular deity. Agni comes first and Indra comes second so forth. Within each section the hymns are regulated in the descending order.


ආර්යයන්ගේ ප්‍රාචීනතම සාහිත්‍යය වේදයයි. භාරතයේ පමණක් නොව මුළු ලොව ම ඇති පැරණිතම සාහිත්‍යය මෙයයි. සෙසු සාහිත්‍යයන්හි ක්‍රමික වූ අඛණ්ඩ පරිපූර්ණ විකාශනයක් අප්‍රත්‍යක්ෂය. එහෙත් මෙය එලෙස කඩින් කඩ ලුප්ත නොවූ පරිපූර්ණ සාහිත්‍යයකි.[1] ඉන්දියාවට සංක්‍රමණය වූ ආදි ම ආර්ය ගෝත්‍රිකයන්ගේ පැබඳුම්, හෘද්ගත භාවාත්මක චේෂ්ටාවන් අඩංගු ගීතිකාවන්ගෙන් වෛදික සංහිතා සාහිත්‍යය සකස්ව ඇත. ආර්ය ගෝත්‍රිකයෝ ජීවිතය ප්‍රීතියෙන් ගතකළහ. ඔවුහු නිර්භීත වූ ද රණකාමී වූ ද ආගමික


© කථිකාචාර්ය පූජ්‍ය උඩවෙල රේවත හිමි



සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

හැඟීමෙන් නොසිස් වූවෝ ද වන බව ගීතිකා පිළිබඳ විචාරපූර්වක අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

පැරණි ම ඉන්දීය සාහිත්‍යය ස්මාරකය ලෙසින් මෙන් ම පැරණි ම ඉන්දු-යුරෝපීය ස්මාරකය ලෙසත්, ලෝක සාහිත්‍යයෙහි වේදයට වැදගත් තැනක් හිමි වේ. මෙහි පවත්නා පෞරාණික බව නිසා ම මෙය ඉන්දීය සාහිත්‍යයෙහි මූලස්ථානය ද වේ.[2] තව ද වේද සාහිත්‍යය පිළිබඳ අනභ්‍යාසයෙන්, තත්වූ පරිදි ඉන්දියානුවන්ගේ ආධ්‍යාත්මික ජීවිතය හා සංස්කෘතිය වටහා ගත හැකි නොවේ.

සම්භාවිත වෛදික සාහිත්‍යය මන්ත්‍ර හෙවත් සංහිතා හා බ්‍රාහ්මණ යැයි දෙපරිදි වේ. මන්ත්‍ර කොටස ත්‍රිපිටක සාහිත්‍යයෙහි එන පාළිය වැනිය. බ්‍රාහ්මණ කොටස අටුවා වැනිය. අටුවාව නොමැතිව පෙළ තේරුම්කළ නොහැකි වන්නා සේ ම, බ්‍රාහමණවලින් තොරව වේදය තේරුම්ගත ද නොහැකිය. දී. නි. අම්බට්ඨ සූත්‍රයෙහි වේදකර්තෘන් පිළිබඳ **මන්තානං කත්තාරො - මන්තානං පවත්තාරො** යන අර්ථ විවරණ හමුවේ. මන්ත්‍රයන්හි ආදිකර්තෘ නම් වෙන බව ඉන් අභිප්‍රේතභාවය යි. වේදයේ ජන්මභූමිය වූයේ ආර්‍යයින්ගේ තෙවැනි වාසස්ථානය වූ කුරු රටයි. ඒ ප්‍රදේශය ආර්‍යාවර්ත නමින් ද හැඳින් වේ.[3] කෙසේ වෙතත් වේදය ඉන්දියාවේ පූජ්‍ය භාෂාවේ සහ සාහිත්‍යයෙහි ආදිතම හා වැදගත්ම අවධිය නියෝජනය කරන්නකි. එහෙත් වේද ග්‍රන්ථ රචිත කාලපරිච්ඡේදය පිළිබඳ විවිධ විතර්ක පවතී. වේදයේ ආරම්භය ක්‍රි: පූ: 2500 දී පමණ වී යැයි අනුමාන කෙරේ. 03 වන සියවසෙන් පසුවට දින නියම කළ නොහැකි බවට ද මතයක් පවතී.[4]

## වේද යනු කුමක්ද?

වේද ශබ්දය, විද් (ඥානෙ) විද් (සත්තායං) විද් (ලාලනෙ) විද් (විචාරණෙ) යන සතර ධාතුවල නිෂ්පාදනයකි. **- විදන්ති ජානන්ති විද්‍යන්තෙ භවන්ති වින්දන්ති අථවා විදන්තෙ ලභන්තෙ විද්වාංසශ්ච සර්වෙ මනුෂ්‍යාඃ සත්‍යවිද්‍යාං යෛර්යෙෂු වා තථා භවන්ති තෙ වෙදාඃ-**[5] සියලු මනුෂ්‍යයෝ සත්‍යඥානය යමකින් දනිත් ද ලබත් ද විචාරණය කරත් ද යමෙක්හි විද්වත්හු වෙත් ද, ඒ සතර ශාස්ත්‍රයෝ වේද නම් වෙත් යන වියරණ විග්‍රහයට අනුව මීට දෙන ශාස්ත්‍රීය අර්ථකථනය ඥානය යන්න බව හැගේ. එනම් ඒ දිව්‍යඥානයයි.



විද් (ඥානෙ) ධාතුවෙන් කර්මාර්ථයෙහි **අච්** හෝ **ඝඤ්** ප්‍රත්‍යය වී වේද යැයි සෑදී ඇත.[6] දැනගැනීම හෝ දැනීම යනු එහි සාමාන්‍ය අරුතයි. වේද යන්නෙහි අර්ථය දැනුම යි. ඒ ද උතුම් දැනුමයි. එනම් පූජනීය ආගමික දැනුමයි. වේද ගීතිකා අධ්‍යයනයෙන් පසු සම්පූර්ණ ඥානය - දැනුම ලද හැකි බව ආර්‍යයින් විශ්වාස කරන්නට ඇත. වේදයට ටීකා ලියූ ආචාර්‍ය සායනයෝ ද,

**ප්‍රත්‍යක්ෂෙණානුමිත්‍යාවා යස්තූපායො න බුධ්‍යතෙ**
**එතද්විදන්ති වෙදෙන තස්මාත් වෙදස්‍ය වෙදතා**

යනුවෙන්, ප්‍රත්‍යක්ෂාදි ප්‍රමාණයන්ගෙන් දත නොහැකි සත්‍යපදාර්ථය මෙයින් දත හැකි බැවින් මීට වෙද යැයි ව්‍යවහාර කරන බව පවසති.

වේද ශබ්දයෙන් ශුද්ධ ධර්මය යන භාවය ද ප්‍රකට වේ. ඒ අනුව ශුද්ධ ධර්ම ඇතුළත් ග්‍රන්ථ ශුද්ධ ග්‍රන්ථ හෙවත් වේද ග්‍රන්ථ වේ.[7] ආගමික ග්‍රන්ථ කෙරෙහි පූජ්‍යත්වයක් මෙන් ම ශුද්ධත්වයක් ද ආරෝපණය කිරීම සාමාන්‍ය සම්මුතියකි. ඒ න්‍යාය වේද ග්‍රන්ථයන් කෙරෙහි ද යොමු වී ඇති බව වේද යන වචනයෙහි අර්ථවිභාග පරීක්ෂණයෙන් ප්‍රත්‍යක්ෂ වේ.

වේදාන්තර්ගත මන්ත්‍ර ගීත පද්‍ය ප්‍රධාන වශයෙන් කොටස් ත්‍රයකට බෙදේ. එනම්, ඍච් නමින් දක්නා සූක්ත ගීත පද්‍යත්, යජුස් නමින් දක්නා යාග සූත්‍ර පද්‍යත්, සාමන් හා බ්‍රහ්මණ නමින් දක්නා මන්ත්‍ර පද්‍යත්ය.[8] ඍච් යනු ස්තෝත්‍ර ශ්ලෝකයට නමකි. ඒ අනුව ස්තෝත්‍ර ස්වරූපී සූක්ත මෙහි දක්නට ලැබේ. කෙසේ වෙතත් පූර්වෝක්ත මන්ත්‍ර ගීත වෙන වෙන ම එකතු කොට සකස් කරන ලද ග්‍රන්ථය සංහිතා නම් වේ.

ඍග්, යජුර්, සාමන්, අථර්වන් යැයි නාම වශයෙන් වේදය චතුර්විධය. එහෙත් ඍග් යජුර් සාමන් යන වේදත්‍රයට පමණක් පළමුව සංහිතා පිළියෙළ වී තිබිණි. ඒ අනුව පෞරාණිකයෝ චතුර්වේද යන සම්මුතිය නොපිළිගත් අතර ත්‍රිවේදය යන අභිධානය පිළිගත් බවත් පැහැදිලි වේ. පැරණි ව්‍යවහාරයේ හැටියට වේදත්‍රයකි. සතරවැන්න හෙවත් අථර්වන් වේදය පසුකාලීන එකතුවකි. වේදත්‍රය - ත්‍රයී - නමින් ද ව්‍යාවහෘත විය.

**-යද් ඍචෛ හොත්‍රං ක්‍රියතෙ යජුෂා ආධ්වර්යව**
**සතම්නෝද්ගීථං ව්‍යාරබ්ධා ත්‍රයී විද්‍යා භවති-**

යන උද්ධෘතයෙන් ද ඒ වග තහවුරු වේ.[9] බුද්ධ කාලයේ දී ද පිළිගෙන තිබුණෙ ත්‍රිවේදය පමණකි. ත්‍රිපිටක පාළියේ **තින්නං වේදානං පාරගූ - තෙවිජ්ජ බ්‍රාහමණා** යන සඳහන් බහුලව හමු වේ. මෙයින් යථෝක්ත

කරුණ තවදුරටත් සනාථ වේ. අථර්වන් යනු මිනිසාගේ දෛනික කාර්යයන් ඉටු කරනු වස් උපකාර වන්නේ යැයි විශ්වාස කරන ලද ලෞකික මන්ත්‍ර ගීයට අභිධානයකි. අථර්වන් පද්‍යත් ස්වකීය ලෞකික ඕනෑ එපාකම් ඉටුකරගැනීම සඳහා භාවිත කළහ. මේ නිසා පැරණි වෛදිකයෝ අථර්වන් වේදය වේදයක් ලෙසින් නොපිළිගත්හ.

අථර්වන් වේදය වේදයක් ලෙස පිළිගැනුනේ පසුකාලීනවය. එහෙත් එහි ඇතුළත් මන්ත්‍ර - පද්‍යයන් ඈත අතීතයට නෑකම් කියන බවට සාධක හමු වී ඇත. භාරතීයයෝ මෙය වේදයක් ලෙසින් පිළිගන්නට මැලිවෙති. එය පශ්චාත් කාලීන එකතුවක් වීම හා එහි ඇතුළත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ ආකල්පය ද මෙහිලා තදින් ම බලපා ඇත. කරුණු මෙසේ වුවත්, සාරය, විෂය හා ස්වරූපය වශයෙන් වේදය එකක්මය. අද්‍යතනයෙහි ප්‍රකටව පැණෙන වේද ග්‍රන්ථ 04 කි.

i. ඍග්වේදය
ii. යජුර්වේදය
iii. සාමවේදය
iv. අථර්වන්වේදය[10] යනුයි.

පසුකාලීනව මන්ත්‍ර ගීත වෙන වෙනම එකතු කොට මේවාට සංහිතාවන් පබැඳූහ. ඒ නිසා ඍග් වේදසංහිතා, සාමවේද සංහිතා - යජුර්වේද සංහිතා හා අථර්වන්වේද සංහිතා නමින් ද පූර්වෝක්ත ග්‍රන්ථ චතුර්ථය හැඳින්වේ.

## ඍග් වේදය

චතුර්වේද ග්‍රන්ථ සන්තතිය අතුරින් ප්‍රථම වේදකෘතිය ඍග්වේදයයි. මුළු ලොව ම විකසිත සර්ව සාහිත්‍යය අතර ඍග්වේදය පැරණිතම කෘතිය වේ. ඉන්දු ආර්ය මනුෂ්‍ය වර්ගයාගේ භාෂාව හා සභ්‍යත්වය පිළිබඳ ප්‍රාමාණික අධ්‍යයන කාර්යයෙහි අද්විතීය මූලාශ්‍රයක් වශයෙන් ද මෙය විද්වජ්ජන සම්භාවිතය. භාරතීය සාහිත්‍ය වංශය පිළිබඳ විචාරපූර්වක අධ්‍යයනයක යෙදෙන වින්ටර්නිට්ස් නම් ජර්මන් පඬිවරයාගේ - භාරත දේශවාසීන්ගේ සිත ක්‍රියා කළ හැටි පමණක් නොව ඉන්දු යුරෝපීය නමින් හඳුන්වනු ලබන කල්පිත භාෂාව ව්‍යවහාර කළ මනුෂ්‍ය සමූහයා පිළිබඳ තත්ත්වාවබෝධයක් ලබාගැනීමට ඍග්වේදය මහෝපකාරී වේ.[11] යන නිර්වචනය ද මෙහිලා පූර්වෝක්ත මතය ම සනාථ කරයි. ඒ අනුව ඍග්වේද සංගෘහිත ක්ෂේත්‍රයන් කවරාකරදැයි



නිගමනය ද කළ හැකිය. භාරතීය ආගම් දර්ශන හා සමාජය සම්බන්ධ වැදගත්, හරවත් ඓතිහාසික කරුණුවල ප්‍රභවය හා ක්‍රමික විකාශය පිළිබඳ අඛණ්ඩ වෘත්තාන්ත ඍග්වේදයෙහි අන්තර්ගත වේ.

## ඍග් අර්ථ විභාගය

ඍච් යනු ඡන්දොබද්ධ මන්ත්‍රයි **(පාදෙනාර්ද්ධර්චෙනො පෙතාවෘතතබදධා මනත්‍රාඃ ඍචඃ)**[12] යනුවෙන් ශුක්ල යජුර්වේද කණ්ව සංහිතා භාෂ්‍යයෙහි සඳහන් වේ. ඍච් ශබ්දය ස්තුත්‍යර්ථ ඍච් (ධාතුවෙන්) නිෂ්පන්නය. **(ඍච්‍යතෙ ස්තූයතෙ අනයා ඉති ඍච්)**[13] මෙම විවරණයෙන් ද ප්‍රස්තුතය පිළිබඳ යම් එළියක් ලැබේ.

එනම් මෙහි කල්පිත දේව සමූහයක් කෙරෙහි ආදි යුගයේ මිනිසාගේ හද පත්ලෙන් උපන් අව්‍යාජ ස්තුති ගායනාවන් සමූපේත වී ඇති බවයි. ඒ බිය හා ගෞරවය මුසු ශ්‍රද්ධා භක්ති පදනමක් මත වීම විශේෂ ලක්ෂණයකි. ඍච් යනු ස්තෝත්‍ර ශ්ලෝකයට ද අභිධානයකි. - **අලෞකිකං පුරුෂාර්ථෝපායං වෙත්ති අනෙන ඉති වෙද ශබ්ද නිර්වචනම්-** අලෞකික පුරුෂාර්ථෝපාය මෙයින් දැන ගනී. යනු වේද ශබ්දයෙන් විහිත අර්ථයයි. වේද ශබ්දය ඥානාර්ථක විද් ධාතුවෙන් උපන්නකි. ඒ අනුව ඍග් බහුල කොට ඇති වේදය ඍග්වේද නම් වේ. ඍග් හෙවත් ඍච් කීපයක එකතුව සූක්ත නම් වේ. සූක්ත යනු උතුමෙකු විසින් කියන ලද්ද හෝ උතුම් ලෙස කියන ලද්ද හෝ උතුමෙකු ගැන කියන ලද්ද යන භාවයන් වාච්‍ය කරන්නකි.[14] ඒ අනුව ඍග්වේදය යනු පූජ්‍යපද්‍ය ඇතුළත් වේදයයි.

ඍග්වේදය ඍග්වේද සංහිතා යන අපරනාමයෙන් ද ව්‍යවහෘත ය. මෙය සෙසු වේදත්‍රයට පූර්වව එනම් ක්‍රි: පූ: 600 දී පමණ පදපාඨ, ක්‍රමපාඨ, සංහිතා පාඨාදි ස්මරණෝපායවලින් පාරම්පරිකව අච්චජින්නව පැවැත ඇත. සං+ධා ධාතුවෙන් නිපන් සංහිතා යන්න එකට තැබූ, එක්රැස් කිරීම යන අරුත් ජනනය කෙරේ.[15] ඍග්වේදයේ බොහෝ ඍක් ඇතුළත් බැවින් එහි ප්‍රාමාණික ප්‍රාඥයෝ එය බහවෘච නමින් ද හඳුන්වති. යාගකරන බමුණෝ යාගකාරකයෝ නම් වෙති. ඔවුහු සතර දෙනෙකි. හොතා, අධ්වර්යු, උද්ගාතා හා බ්‍රහ්මා යනු ඔවුහුය.[16] ඍග්වේදය භාර තැනැත්තා **හොතා** නම් වෙයි. යාග අවස්ථාවේදී ඍග්වේද ගී ගැයීම ඔහුගේ කාර්යයයි.

ඍග්වේදය ඒකකර්තෘක කෘතියක් නොවේ. එමෙන් ම එහි සූක්ත එක ම කාලයකට අයත් ඒවා ද නොවේ. සෙසු වේදත්‍රයට

පූර්ව ක්‍රි: පූ: 600 මෙහි රචිත කාලය බව බහුතර පිළිගැනීමයි. වේද යුගයේ විසූ පෞරාණික ආර්ය කවීන්ගේ ස්තෝත්‍ර පද්‍ය රචනා ඒ කවියාගේ පාරම්පරිකයන් විසින් පවුලෙ වස්තු ලෙසින් මුඛ පරම්පරාගත ව සංහිතා රචනා කාලය තෙක් ආරක්‍ෂා කරන ලදි.

කෙසේ වුවද, ඍග්වේද ගීතිකාවන්හි එක්තරා විවිධත්වයක් ඇති අතරම, එක්තරා සමතාවක් ද දක්නට ලැබේ. එසේ ම භාෂා විලාසය අතින් ද ශබ්දමාලා අතින් ද රචනා ශෛලිය අතින් ද ව්‍යාකරණය අතින් ද ඡන්දස අතින් ද ගැබ් වී ඇති අදහස් අනුව ද ප්‍රකට නේක වෙනස්කම් අනුව ඍග්වේද ගීතයන්ගේ රචනා කාලය පිළිබඳ පෙරපසුකම් බොහෝවිටම තීරණය කළ හැකිව තිබේ.

## ඍග්වේදයෙහි මණ්ඩල

ඍග්වේද සූක්ත බෙදා දක්වා ඇති ක්‍රමද්වයකි. ඉන් එකක් නම් අෂ්ටක - අධ්‍යාය - වර්ග වශයෙන් බෙදීමයි. දෙවැන් නම් මණ්ඩල, අනුවාක හා සූක්ත වශයෙන් බෙදීමයි. ඍග්වේද සංහිතාවේ අෂ්ටකය - මණ්ඩලය යනු ප්‍රකට ප්‍රභේදද්වයකි. මෙහි අෂ්ටක අට(08)කි. එක් එක් අෂ්ටකයෙක අධ්‍යාය 08 බැගින් අධ්‍යාය 64 කි. එක් අධ්‍යායක් වර්ග ගණනකින් යුක්තය. එබඳු වර්ගයන්හි එකතුව 2006 කි.[17] එක් වර්ගයක් සාමාන්‍යයෙන් ඍච් හෙවත් පද්‍ය පහකින් යුක්තය. එහෙත් ඇතැම්විට ඊට වැඩිව ද ඇතැම් විට අඩුව ද ඇත. පශ්චාත් කාලීනයන්ගේ අධ්‍යයනයෙහි පහසුව සලකා මෙලෙස වර්ගීකරණය කර ඇත.

දෙවන ක්‍රමයේ බෙදීම පෞරාණික ක්‍රමයයි. එහිදී ඓතිහාසික වූ ද ශාස්ත්‍රීය වූ ද කරුණු යටතේ එය වර්ගීකරණය කර ඇත. මෙම බෙදීම් ක්‍රමය බ්‍රාහ්මණ ග්‍රන්ථයන්හි සඳහන් වී තිබීම ද සැලකිය යුතු කරුණකි. මේ ද්විතීය වර්ගීකරණයට අනුව ඍග්වේද සංහිතාව මණ්ඩල හෙවත් ග්‍රන්ථ දහයකට බෙදා තිබේ. පළමු මණ්ඩලයෙහි අනුවාක හෙවත් කොටස් 24 කි.[18] දෙවැන්නෙහි 04 කි. තෙවැනි හා සිවුවැනි මණ්ඩලද්වයෙහි ඇත්තේ අනුවාක 05 බැගිනි. අනුවාක 06 බැගින් පස්වෙනි, හයවෙනි හා හත්වෙනි මණ්ඩලත්‍රයෙහි අඩංගු වේ. අටවැන්නෙහි 10 කි. නවවැන්නෙහි අනුවාක 07 ක් වන අතර, අවසාන මණ්ඩලය හෙවත් 10 වැනි මණ්ඩලයෙහි ඇත්තේ අනුවාක 12 කි. මේ අනුව අනුවාක සියල්ල 85කි. එක් අනුවාකයක සූක්ත ගණනක් ඇතුළත් වේ. එක සූක්තයක



පද්‍ය ගණනක් වේ. තව ද ඒ එක් එක් සූක්තයට දේවතාවෙක් ද ඍෂිවරයෙක් ද ඡන්දසක් ද හිමිව තිබේ. ඍෂිදෙවතා - ඡඥස් යන වචනවලින් කුමක් ව්‍යා කරන්නේදැයි මතභේද පවතී. මේ පිළිබඳ විවරණයක් වාත්සයායනයේ ස්වාත්‍රක්‍රමණී යෙහි මුල හමු වේ.

- **යස්‍ය වාක්‍යං ස ඍෂිඃ යා කෙනාව්‍යතෙ සා දෙවතා යදක්‍ෂරපරිමාණං තච්ඡන්දඃ** -
- **අර්ථප්සව ඍෂයො දෙවතාශ්ඡන්දොභිරුපාධාවන්** -

යනුවෙන් පූර්වෝක්ත වචනාර්ථයන් විශ්ලේෂණය වේ. මේ හැර ක්‍රි: ව: 14 සියවසේ විසූ සායණයන් වේදාර්ථප්‍රකාශ නම් ඍග්වේද භාෂ්‍යයෙහි ද ඍෂිත්වය විවරණය කර ඇත. එනම් **අතීන්ද්‍රියස්‍ය වෙදස්‍ය පරමෙශ්වරානුග්‍රහෙණ ප්‍රථමතො දර්ශනාත් ඍෂීත්වම්** - යනුවෙනි.[19]

ඍග්වේද ඍච් හෙවත් ස්තුති ගීතිකාවලින් පරිමිතය. එබඳු ගීතාවලි සම්භාරයෙන් ජනිත සූක්ත හෙවත් පද්‍යබන්ධන (hymns) 1028ක් මෙහි සංගෘහිතය.[20] මණ්ඩලයන්හි එන සම්පූර්ණ ඍෂිවාක්‍ය සූක්ත යන නමින් ව්‍යාවහෘත කෙරේ. (සම්පූර්ණ ඍෂි වාක්‍යන්ත සූක්තමිත්‍යභිධීයතෙ) මණ්ඩල සියල්ලෙහි සූක්ත 1017 ක් පමණක් ඇති බවට ද මතයක් පවතී. එහේත අෂ්ටම මණ්ඩලයෙහි වාලඛිල්‍ය නම් අතිරික්ත සූක්ත 11ක් ද දක්නට ලැබේ. ඒවා ද එකතුව සියල්ල 1028ක් වේ.

| **මණ්ඩලය** | **සූක්ත ගණන** |
|---|---|
| I | 191 |
| II | 43 |
| III | 62 |
| IV | 58 |
| V | 87 |
| VI | 75 |
| VII | 104 |
| VIII | 114 |
| IX | 114 |
| X | 191[21] |
| **එකතුව =** | **1039** |

යනුවෙන් අපර සූක්ත වර්ගීකරණයක් ද දක්නට ලැබේ. එහෙත් සියලු සූක්ත සංඛ්‍යාව 1028ක් බව බහුතර විද්වත් පිළිගැනීමයි. මේ හැරුණු විට ඍග්වේදයේ අඩංගු ගීතිකා පිළිබඳ කාලනිර්ණය ද

විවාදාපන්න වී ඇති බව පෙනේ. ඍග්වේදයේ ඉතා පැරණි මෙන් ම නව්‍ය ස්වරූපී පද්‍ය හෙවත් ගීතිකා අයත් වන බවත්, ඉන් ඉතා පැරණි සූක්ත සාමාන්‍යයෙන් ක්‍රි: ව: පෙර අවුරුදු 2000ක් පමණ පරණ ඒවා විය යුතු යැයි යුරෝපීය පඬුවන්ගේ පිළිගැනීමයි. ගංගාධරතිලක් මහතා ජ්‍යොතිශාස්ත්‍රීය සාධක මත එම සූක්තයෙන් ක්‍රි: පූ: 4,000ක පෞරාණික අවධියකට තල්ලු කරයි.[22]

කෙසේ වෙතත්, සූක්තයක ඇති එක් එක් මන්ත්‍රයක් ඍග් (ඍක්) යනුවෙන් හඳුන්වයි. එබඳු මන්ත්‍ර හෙවත් ඍක් 10185ක් ඍග්වේදයෙහි ඇතුළත් වේ. එහෙත් චරණව්‍යූහ ග්‍රන්ථයෙහි 10580කැයි ද ශ්‍රී පාදශර්මී සංස්කරණයෙහි 10552කැයි ද විවිධ විතර්ක පවතී.[23] මෙලෙස ස්ථාවර වූ නිශ්චිත සංඛ්‍යාවක් නො දක්නෙ ඍෂිකාන්තාවන්ගේ රචනා පිළිබඳ ව විචාරකයෝ දරන ආකල්පය නිසාය. මේ පිළිබඳ ඒකමතික බවක් නම් නොදක්නා ලැබේ. මෙම ඍග්, ගද්‍ය හා පද්‍ය වශයෙන් දෙකොටසකට බෙදේ. ඡන්දෝබද්ධ නොවූ මන්ත්‍ර යනු ඉන් පළමුවැන්නයි. ඒවා ගද්‍යයෙන් විරචිතය. දෙවැන්න ඡන්දොබද්ධ මන්ත්‍රයි ඒවා පද්‍යයෙන් නිර්මිතය. මේ හැරුණු විට ඍග්වේදාගත සර්වසූක්තයන් මහාසූක්ත හා ක්‍ෂුද්‍ර සූක්ත වශයෙන් බෙදීමක් ද දක්නට ලැබේ.[24] මහාසූක්තයකට ඍක් 10කට වැඩියෙන් ද ක්‍ෂුද්‍ර සූක්තයකට ඍක් 10කට අඩුවෙන් ද ඇතුළත් විය යුතු බව සාමාන්‍ය පිළිගැනීමයි.

## ඍග්වේදයෙහි සැකැස්ම

ඍග්වේදය කර්තෘ පරම්පරාවක සාමූහික ප්‍රයත්නයක අග්‍ර වූ ප්‍රතිඵලයකි. මෙහි සූක්ත සංඛ්‍යාව 1028 කි. වාලඛිල්‍ය සූක්ත 11 හැර ගනිතොත් 1017 කි. ඍග්වේදය සංහිතාව අද පවත්නා තත්ත්වයට සකස්වීම පිළිබඳ අධ්‍යයනයේ දී එය අවස්ථා තුනක් යටතේ මහාචාර්ය රෝත් විවරණය කරයි.[25]

(1) සංහිතාකාරකයින්ගේ කාලය වන තුරු ඒ ඒ සූක්ත ඒ ඒ කර්තෘවරයාගේ පාරම්පරිකයන් විසින් මුඛපරම්පරාගතව ගෙන ඒම.

(2) එසේ කටපාඩමින් ගෙන ආ සූක්ත ලිපිගත වීම.

(3) අද දක්නට ඇති ස්වරූපයෙන් ඒ සූක්තයන්ගෙන් ඍග්වේද සංහිතාව සකස්වීම. යනුවෙනි.



ඍග්වේද ග්‍රන්ථය ස්වරූප දෙකකින් පරිමිතය.

(1) සංහිතා පාඨ

(2) පද පාඨ

සංහිතා පාඨ යනු සන්ධි සහිත ස්වරූපයයි. සන්ධි විසන්ධි කළ ස්වරූපය පදපාඨ නම් වේ. සංහිතා ස්වරූපයෙන් යුත් හැම පදයක්ම වෛයාකරණ මතානුකූල සන්ධි නීති යටතේ සන්ධි කර ඇති අතර, පද පාඨයේ හැම පදයක් ම වෙන් ව ප්‍රකට ව පෙනෙ සේ සන්ධි විරහිතව යොදා තිබේ.

ඍග්වේදයෙහි මණ්ඩල දහයක් ඇති බවත්, ඒ නිර්මාණ ඒකකර්තෘක රචනාවන් නොවන බවත් ඉහත සඳහන් කෙරිණි. ඍග්වේද සූක්ත රචිත කාලය අනුවත් ස්ථානය අනුවත් නොයෙක් කාලවලටත්, කර්තෘන්ටත්, ස්ථානවලටත් අයත් වෙයි.[26] මණ්ඩල දහය අතුරෙන් 2-7 වැන්න දක්වා මණ්ඩලවලින් කියවෙන කරුණු අතින් ද පිළියෙළ වී තිබෙන ආකාරය අතින් ද අන්‍යොන්‍ය සාම්‍යත්වයක් ප්‍රකට වේ. බ්‍රාහ්මණ ග්‍රන්ථයන් හා වේදාංගයන්හි හා තදනුගත මූලාශ්‍රයාන්තර්ගත විශ්ලේෂණයානුකූලව ද්විතීය මණ්ඩලයේ සිට සප්තම මණ්ඩලය තෙක් ඇති ෂඩ් මණ්ඩලයන්හි කර්තෘත්වය පිළිබඳ ගැටලුවක් නොමැත. ඒ එක් එක් මණ්ඩලයක අඩංගු සූක්ත එක ම කුලයේ කවීන් හෝ ඉසිවරුන් විසින් සංග්‍රහ කොට ඇත. එසේ ම ඒ ඒ කුල විසින් ම සිය උරුමයන් ලෙස ගෙනෙන ලද්දේය. සූක්ත සංගෘහිත ඉසිවරුන් හා බැඳුණු අභ්‍යන්තර සාක්ෂි හා ඇතැම් තැනෙක හමුවන ධ්‍රුවය (අත්වැල් ගායනය) ද මගින් සම්ප්‍රදාය එළි දක්වේ. තව ද එක් එක් ඉසිකුලයට අයත් මණ්ඩල පිළියෙල කිරීමේ දී අනුගමිත ක්‍රමය ද ඒකාකාරී ය. ඒ අනුව ඒවා අනුක්‍රමයෙන් ගෘත්සමද > විශ්වාමිත්‍ර > වාමදෙව > අත්‍රි > භාරද්වජ > වශිෂ්ඨ යන ඍෂීන් හා ඔවුනගේ ඍෂි ගෝත්‍රිකයන් විසින් සම්පාදිතය. ඒ නිසා මේ ෂට් මණ්ඩලය **ගොත්‍රමණ්ඩල** නමින් ද හඳුන්වයි.

**- ශතර්චිනො මාධ්‍යමා ගෘත්සමදො විශ්වාමිත්‍රො වාමදෙවෝත්‍රී භාරද්වාජෝ වසිෂ්ඨඃ ප්‍රගාථඃ පාවමන්‍යඃ ක්‍ෂුද්‍රසූක්තා මහාසූක්තා-**[27] යන උද්ධෘතයෙන් ද පූර්වෝක්ත මණ්ඩල හයෙහි කර්තෘත්වය තහවුරු වේ. ඍග්වේදයට අයත් පැරණිම ගීතිකා අයත්වන්නේ ද මේ මණ්ඩල සයටය. ඒ නිසා මේ ගීතිකාවලට **ගෘහ්‍ය සූත්‍ර** යැයි ද කියනු ලැබේ. **කුලග්‍රන්ථය** යනු ද මීට භාවිත අනෙක් නමකි.[28] කෙසේ වෙතත්, මේ මණ්ඩල අන්‍යොන්‍ය සාධාරණ ගුණොපලක්ෂිත වුවත් සෙසු

මණ්ඩලයන්හි තත් ගුණය අප්‍රකටය. 1, 8, 9, 10 යන මණ්ඩල හතර ඒ ඒ මණ්ඩලයට විශේෂ වූ කරුණු යටතේ පිළියෙල වී ඇත. ඒ අතර අටවෙනි මණ්ඩලය කණ්ව හා අංගීරස් යන ඍෂිවරුන් දෙදෙනා සහ තද් වංශිකයන් විසින් නිපදවන ලදැයි විශ්වාස කෙරේ. 9 වැනි මණ්ඩලය සෝම පානයෙහි ගුණ වර්ණනාභිලාසය විෂය කොට ගත්තකි. මේ නිසා මෙය පුද්ගලික පරම්පරාවකට අයත් නොවේ. තව ද, මෙයට පවමාන මණ්ඩලය යැයි ද කියනු ලැබේ.[29] මෙහි සියලු ම සූක්තවලින් එක ම දෙවියෙකුට එනම්, පවමාන සෝමට අමතන ඒවා වීම ඊට හේතුවයි. සෝමය දේවත්වයට නැඟූ ගීතිකා මෙහි ඇතුළත් වේ. ඊරාණියන්ගේ අවෙස්තා නම් ආගමික කෘතියේ හඩමා නමින් මෙම සෝම යුෂයම හඳුන්වා ඇති බව වියතුන්ගේ පිළිගැනීමයි.[30] 09 වැනි මණ්ඩලයේ වර්ගීයන්ගේ අනන්‍යතාව ඡන්දසයි. එහි 1 - 67 දක්වා ගීත ගයාත්‍රී ඡන්දසින් ද 68-86 දක්වා ගීත ජගතී ඡන්දසින් ද 87 - 97 දක්වා ගීත ත්‍රිෂ්ටුප් ඡන්දසින් ද ඉතිරි සියල්ල වෙනත් ඡන්දස්වලින් ද සංග්‍රහ වී ඇත.[31]

ඍෂිකුල විසින් රචිත එනම් 2-7 වැන්න දක්වා මණ්ඩලාන්තර්ගත සූක්තයන්ගේ පළමුවන වර්ගයෙන් ඉන්ද්‍රට පමණක් දෙවැනි වන අග්නි අමතයි.[32] ඉක්බිති වැදගත්කමින් අඩු දෙවියෝ අමතති. මෙය මේ මණ්ඩලයන්හි දෘශ්‍යමාන සුවිශේෂී ලක්ෂණයකි. මේ දේව ගණ පිළිබඳ සූක්ත පෙළ ගසා ඇත්තේ ඒවායෙහි අඩංගු ගීවල ගණනින් අවරෝහණ පිළිවෙළිනි. එය ද මේවා අතර ඇති කැපී පෙනෙන ලක්ෂණයකි. දෙවන මණ්ඩලයේ සූක්ත 10යේ අග්නිවර්ගීය ගීත 16ක සූක්තයකින් ඇරඹී ගීත 6ක සූක්තයකින් අවසන් කෙරේ. තත් මණ්ඩලයේ ම ඊළඟ වර්ගයේ පළමුවන සූක්තයෙහි ගීත 21 කි. අවසන් වැන්නෙහි ඇත්තේ ගීත 04 කි. මේ නිසා පශ්චාත්කාලීන එකතු කිරීම් ද සිදුවූයේ ආරෝහණ පටිපාට්‍යානුකූලවය.[33] මේ ක්‍රමය දෙවැනි මණ්ඩලයේ විද්‍යමාන වේ. එහි පළමු වර්ගයේ සූක්ත 43 කි. තුන්වැන්නෙ 62 කි. සවැන්නේ 75 කි. සත්වැන්නේ 104 කි. මෙලෙස ඍග්වේදයෙහි වින්‍යාසය සකස් වී ඇත.

ඍග්වේදයට කරන ලද අවසන් එකතුව දසවන මණ්ඩලයයි. එහි භාෂාවත්, විෂය ක්ෂේත්‍රයත් පසුකාලීන ලකුණු පළ කරයි. පළමු හා මෙම අවසන් මණ්ඩලයේ සූක්ත පෙළගැස්ම සමාන ස්වරූපයක් දරයි. මෙහි අඩංගු ඇතැම් සූක්ත අවශේෂ මණ්ඩලයන්හි ද විද්‍යමාන



වේ. එසේ ම ඉසිවරු සමූහයක සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස මෙම දසවන මණ්ඩලය හැඳින්විය හැකිය. ඇතුළත් කරුණුවලින්, නූතන ලක්ෂණ ප්‍රකටවුව, සෙසු මණ්ඩලයන්ට ආවේණික පෞරාණික කාව්‍යමය ගුණය මෙහි නැතුවා නොවේ. ඒ අනුව පූර්ව මණ්ඩලයන් අතුරෙන් අත්හැරී ගිය සූක්තවල එකතුවක් ලෙස දසවැන මණ්ඩලය හඳුන්වන්නෝ ද සිටිති.[34] භාෂාමය වශයෙන් නව්‍යතාවක් පිළිබිඹු වෙන අතර දාර්ශනික විමර්ශනයක් ද මෙහි අන්තර්ගත සුවිශේෂ ලක්ෂණයෝ ය.

වයසින් බාල ම මණ්ඩල ලෙසින් පිළිගෙන ඇත්තේ 01 වන හා 10 වන මණ්ඩල දෙකයි. මෙම අද්‍යන්ත මණ්ඩලද්වයෙහි කර්තෘත්වය හා කාලනියමය පිළිබඳ විචාරක ලොව ඒකමතික බවක් නොමැත. ඒවාහි විශ්ලේෂිත කරුණුවලට අනුව මේවා පශ්චාත්කාලීන වන බව බහුතරයකගේ විශ්වාසයයි. ප්‍රථම මණ්ඩලයෙහි මධුඡන්දාදි ඍෂීන් කළ මන්ත්‍රාදිය විද්‍යමාන වේ. දශම මණ්ඩලයෙහි ත්‍රිත, ත්‍රිශිරසාදි ඍෂීන් විසින් රචිත මන්ත්‍රාදිය ඇතුළත් වේ.[35] කෙසේ වෙතත්, අද්‍යන්ත මණ්ඩලද්වයෙහි සංග්‍රහ වී ඇති සූක්තයන්හි භාවිත ව්‍යාකරණ රීතින් හා අඩංගු වී ඇති දාර්ශනික චෛතසිකයන් ද නිසා ඒවා පශ්චාත්කාලීන බව ඔප්පු වේ. විශේෂයෙන් සකු සාහිත වංශයෙහි පසුකාලීනව විකසිත වූ දර්ශනවංශයෙහි මූලබීජවල ඡායාව මෙම අද්‍යන්ත මණ්ඩල දෙක්හි විද්‍යමාන බව ප්‍රත්‍යක්ෂ කාරණයකි. මේ හැරුණු විට මණ්ඩලීය සූක්ත හා සම්බන්ධයක් නොදක්නා වාලඛිල්‍ය ගණයෙහිලා ගැණෙන සූක්ත ද පදපාඨයෙහි සඳහන් නොවන ඍග් වේදයෙහි VII 59, 12, x 20, x 120,10 x 190 1 - 3 යන ශ්ලෝක ද පශ්චාත්කාලීන එකතුකිරීම් වශයෙන් සලකයි.[36] මෙලෙස ඍග්වේදයෙහි බහිඃ ස්වරූපය පිළිබඳ විමසුමක යෙදිය හැකිය. බාහිරාකෘති විමර්ශනයෙන් පමණක්, හුදෙක් ප්‍රස්තුතය පිළිබඳ යථාවබෝධයක් ලද හැකි නොවේ. තත් අභිමතාර්ථ සාධනයෙහිලා ඇතුළාන්තයෙහි ප්‍රබුද්ධ මනසින් යාත්‍රා කළ යුතුමය.

## ඍග් වේදයෙහි අන්තර්ගතය

ඍග්වේදය චතුර්වේදයන් අතුරෙන් පෞරාණිකම කෘතියයි. එහි බාහිරාකෘති විශ්ලේෂණයෙන් ද එහි සැකැස්ම පිළිබඳ පමණක් නොව එහි සන්දර්භය පිළිබඳ යම් අවබෝධයක් ලබාගැනීම දුෂ්කර නොවේ. කෙසේ වෙතත්, ඍග්වේදය ආදි ඉන්දු - ආර්‍ය ජනයාගේ

සිතුම් - පැතුම් විශ්වාස ඇදහිලි ඇතුළත් කෞතුකාගාරයකි. සැබවින් ම, ඔවුනගේ ජීවිතය පිළිබඳ ව, ජීවන දර්ශනය පිළිබඳ කැඩපතකි. වෛදික ආර්යයා එක් ස්ථානයක නොවිසූ සංචාරශීලීව දිවිගෙවූවෙකි. ඔවුනගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය විය. එක ම විශාල ප්‍රදේශයක විසූ මොවුන් දුරාතීතයේ **ඉන්දු ඊරාණීය ජන සමූහය** නමින් හැඳින්විණ. ඔවුහු හින්දු කුෂ් කඳු අතරින් ඉන්දියාවට සංක්‍රමණය කොට ඇත්තාහ. කෙසේ වෙතත්, සංචාරශීලී වූ මොවුහු ස්වභාවධර්මයාගේ නොයෙක් ශක්තිවල හා නොයෙක් සිද්ධීන්හි යථා තත්ත්වය වටහාගැනුමට අපොහොසත් වූහ. ඒ නිසා අදෘශ්‍යමාන බලයක් ඇතැයි ද මිනිසාට එයින් ශුභාශුභ ඵල විපාක වෙතැයි ද කල්පනා කළහ. චන්ද්‍ර, සූර්ය, තාරකා ගර්ජනා ගිනිකඳු ජලාශ ආදියෙහි කලින් කලට ඇතිවෙන විවිධ විපරිණාමයන් තත් වූ පරිදි නොදත් එකල මිනිසා ඒවාට අනවගම්‍ය අදෘශ්‍ය බලයක් ඇතැයි සිතූහ. ඒ බලය දේවත්වය - දේව බලය යනුවෙන් හඳුන්වන්නට ඇත. තදනන්තරව ඒ බලයන්ට ජීවත්වය හා සමාජයෙහි උසස් තැනක් ද හිමිකර දී පිහිට ඉල්ලීමට ගීතිකා ද සකස් කර ගත්හ. ස්වාභාවික ව සිදුවෙන අයහපත දේවකෝපය හෝ ශාපය නිසා වන්නකැයි ද තමා කැමැති දෙයක් සිදු වුවහොත් එය දේවප්‍රසාදය නිසා වන්නකැයි ද විශ්වාස කරන්නට පෙළඹුණහ.

මෙලෙස ඍග්වේදයෙහි දේවකථාවන්ගේ ආරම්භය සනිටුහන්ව ඇත.

> **වේදය හා දේවත්වය ශරීරය හා ප්‍රාණය මෙන් ඒකාබද්ධව පවතින්නකි. ඍග්වේද ගීතිකාවල ප්‍රාදුර්භාවය වූයේ ද දේවත්වය උඩය...**[37]

යන නිර්වචනය ද මෙහිලා වැදගත් වේ. ආර්යයන්ගේ විශ්වාස හා ප්‍රාර්ථනා ආදියේ පටන් ම දේව විශ්වාස පදනමක් මත ගොඩ නැඟී ඇත. මේ පිළිබඳ ජර්මන් පඬිවරයෙකු වූ කයි ගී ගේ නිර්වචනය වැදගත් වේ.

> *ඍග්වේදයෙහි සූක්ත අතුරෙන් වැඩි කොටස එවකට ආර්යයන් පිදූ දෙවිවරුන් අමතා පිරිනමන අයැදුම් සහ ප්‍රශංසාත්මක වර්ණනාය. ඔවුන්ගේ හද පත්ලෙන් පැන නගින අව්‍යාජ හැඟීම් ද සදාකාලික දෙවිවරුන්ගෙන් ඉල්ලන ආධාරෝපකාර හා ඉදිරිපත් කරනු ලබන පූජාව පිළිගැනීම පිණිස කෙරෙහි ආරාධනා ඇතුළත් සිතුම්*



> *පැතුම් ද වෛදික ගීවල නිතරම දැකිය හැකිය. සත්‍ය වශයෙන් ම කවියාගේ මුව පොපියන්නෙ දෙවියා තමා තුළ ඇතිකළ ප්‍රසාදය හා සිය හද තුළින් නගින හැඟීම් ප්‍රකාශ කිරීමටය.*[38]

යනුවෙන් ඔහු විචාරපූර්වක විවරණයක් කරයි. සැබැවින් ම ඍග්වේදයෙහි සන්දර්භය සංක්ෂිප්ත ව ගොනු කළහොත් යථෝක්ත නිර්වචනය සාධාරණ වූ සිතිවිල්ලකි. ඍග්හි දේවකථාවන්ගේ ප්‍රභවය හා ක්‍රමික විකාශය ඇතුළත් වේ. එහි එන බොහෝ සූක්තයෝ දේවතා ස්තුති පිණිස ම වෙන් ව ඇත. ඍග්වේදය පිළිබඳ විමසුමක යෙදෙන වින්ටර්නිට්ස් පඬිවරයා - මෙහි දේවකථා හැඩ ගැසෙන හැටි අපට ප්‍රත්‍යක්ෂව පෙනේ යැයි[39] පවසයි. ඍග්හි පැණෙන දෙවිවරුන්ගේ නම් පමණක් ගෙන නිරීක්ෂණයෙන් දෙවිවරුන්ගේ ආරම්භය හා ඔවුනගේ ස්වරූපය පිළිබඳ දත හැකිය.

ඍග්වේදය කළ ඍෂීන්ගේ ඥාන චක්ෂුසයට මුලින් විෂය වූයේ ස්වභාවධර්මය (Naturalism) හා ඊට ම අයත් සූර්ය චන්ද්‍ර විද්‍යුත් ආදි නොයෙක් වස්තුය. සිත්හි ඇති වූ චමත්කාරය නිසා මෙවැනි ස්වාභාවික වස්තූන්ට මනුෂ්‍යත්වාරෝපණය (Anthropormorphism) කළහ. මුල් කාලයේ විසූ වෛදික ඍෂිහු පළමුව හිරු දෙවි - සඳු දෙවි - ගිනි දෙවි ආදි දෙවිවරුන් නොයැද්දාහ. ඔවුහු ආයාචනා පූර්වක වන්දනමානාදිය කළෝ ස්වභාවධර්මයේ විවිධාංගයන්ටය. ඔවුනගේ සැලකිල්ල හිමි වූයේ දෛනික අහසේ පෙනෙන විදුලිය, මිහිපිට නිතර ජ්වලිත ගින්න හා තවත් දෘශ්‍යමාන නොයෙක් ස්වාභාවික වස්තූන්ටය.

ඍග්වේදයේ දේව වර්ණනයට බඳුන් වෙන සූර්ය, සෝම (සඳු), අග්නි, පෘථිවි, උෂස් (උදාහිරු), මරුත් (සැඩ සුළඟ) යන දෙවියන්ගේ ප්‍රකෘති තත්ත්වය ස්වභාවධර්මයේ ඒ ඒ දේට හිමි අනන්‍යතාවෙන්ම යුක්ත වූ බව ඒ නාම සංඥා විභාගයෙන් දත හැකිය. එහෙත් නාමිකව පමණක් හමුවෙන ඔවුනට ආවේණික වූ ප්‍රකෘතිය අප්‍රකට දේව සමූහයක් ද හමුවේ. ඒ අතර ඉන්ද්‍ර - වරුණ - මිත්‍ර - අදිති - පූෂන් - අශ්වින් - රුද්‍ර - පර්ජන්‍ය යනාදි දෙවිවරු ප්‍රධාන වෙති. කාලාන්තරයක් තිස්සේ ආර්ය ජාතීන්ගේ ගෞරව බුහුමනට ලක් වූ රුද්‍ර හා විෂ්ණු ද මේ ගණයට එක්ව සිටිත්. එහෙත් ඍග්හි පැබැඳුම් අතර ආර්යයන්ගේ මහත් සම්මානයට පාත්‍රවූවෝ වූයේ ඉන්ද්‍ර - වරුණ - අග්නි ආදි දෙවිවරුය.[40]

අග්නි යනු ගින්නයි. අග්නිය දේවත්වයෙන් වෛදිකයෝ පිදූහ. වැදගත්කමින් අග්නි දෙවැනි වනුයේ ඉන්ද්‍ර දෙවිඳුට (II 12) පමණි. අග්නි දේව වර්ණනයට ඍග්වේදයේ සූක්ත 200 ක් පමණ වැය කොට ඇත. අග්නි සංකල්පයෙන් කෙරෙන්නෙ යාග ගින්න සචේතනීකරණයයි. දෙවියන්ට පිදෙන යාගයෙහි සාරය ගෙන යන්නේ අග්නිය. මේ නිසා අග්නිට සෙසු දේව පරපුර අතර විශේෂ තැනක් හිමි වේ.

අග්නිමීළෙ පුරොහිතං
යඥස්‍ය දෙවමෘද්විජම්
හොතාරං රත්නධාතමම්[41]

*(මම) යාගයේ දිව්‍ය සංවිධායක ගෘහපූජක, යදින්නා වෙන ධනය තැන්පත් කරන අග්නිය වර්ණනා කරමි. යනාදී පරිදි අග්නි දේව වැනුම අරඹයි. ඉක්බිතිව අග්නිට සම්පූර්ණ මනුෂ්‍යත්වරෝපණයට උත්සුක වී ඇත. එහෙත් එය අසාර්ථක වී ඇත.*

අග්නෙ යං යඥමධ්වරං
විශ්වසතඃ පරිභූරසි
ස ඉද්දේවෙෂු ගච්ඡති[42]

*අග්නි වෙඩරු පිඩක් ඇත්තෙකි. ගිනිදළු කෙසින් යුත්තෙය. තියුණු හනු ඇත්තෙකි. රන්වන් දත් ඇත. ඔහුගේ දිවගැන නිතර විස්තර කෙරේ. දෙවියන්ගේ පිදවිල්ල කා දමන්නෙ එයිනි. මේ හැරුණු විට සිවුපාවුන් සමග ද ඔහු සම්බන්ධ කරවයි. - ඔහු තප්පුලන ගොනෙකි. ඔහු දිව්‍යමය කුරුල්ලෙකි. අග්නිය අවකාශයෙහි රාජාලියාය. කුරුල්ලෙකු ගසක් මත ලැග සිටින්නාක් මෙනි. වනය හෝ ගිතෙල් ඔහුගේ ආහාරයයි.*[43]

මෙලෙස අග්නි දෙවි ඍග්වේද කවියාට වඩාත් සමීප දෙවිකෙනෙකු ලෙසින් වැජඹුනු බව පෙනේ. හව්‍ය වාහන- ශක්ති පුත්‍ර - ජාතවේද යනු අග්නියට භාවිත කළ විශේෂයෝය.

සනඃ පිතෙව සූනවෙ - ග්නෙ සූපායනො භව සචස්වා නඃ ස්වස්තයෙ[44]
''අග්නිය, එසේ පුතා කෙරෙහි පියා මෙන් අපට පහසු ප්‍රවේශ මඟීයක් වනු මැනැවි. අපේ යහපතට අප සමග ජීවත්වනු මැනවි.''
යන සඳහනට අනුව අග්නි දෙවියා හා සමකාලීන වෛදික ගෘහපතියා අතර පැවැති සමීපතර බව මනාව පැහැදිලි වේ.

ඍග් වේද සූක්ත අතුරෙන් හතරෙන් එකක් තරම් වැයකොට ඇත්තේ ඉන්ද්‍ර දෙවි වැනුමටය. වෛදික ජනතාවගේ ජනප්‍රිය ම දෙවියා වීම ඊට හේතුවයි.



යො ජාත ඒව ප්‍රථමො මනස්වාන්
දෙවෝ දේවාන් ක්‍රතුනා පර්යභූෂත්
යස්‍ය ශුෂ්මො ද්‍රෝදපි අභ්‍යසේතාං
නෘම්ණස්‍ය මහ්නා ස ජනාස ඉන්ද්‍රඃ[45]

යනාදි පරිදි ඉන්ද්‍ර දෙවිඳුන්ගේ ස්වරූපය ගැන විස්තර වේ. ඒ අනුව ඔහු උපතින්ම සෙසු දෙවියන් අභිභවනය කළ බුද්ධියෙන් හා ශක්තියෙන් ආඪ්‍යතර වූවෙකි.

යඃ පෘථිවීං ව්‍යථමානාමදෘංහද්
යඃ පර්වතාන් ප්‍රකුපිතාං අරම්ණාත්
යො අන්තරීක්ෂං විමමේ වරියෝ
යො ද්‍යාමස්තභ්නාත්ස ජනාස ඉන්ද්‍රඃ[46]

තව ද සලිත පෘථිවිය නිශ්චල කිරීම, ප්‍රකෝපිත පර්වත එක්තැන් කිරීම, අවකාශය පුළුල්ව විස්තීර්ණ කිරීම යනාදී වීරක්‍රියා කළේ යමෙක් ද ඔහු ඉන්ද්‍රයි. යනුවෙන් ඉන්ද්‍ර දෙවියන් සතු වීරත්වය හා ඔහු කළ වීර ක්‍රියා ගැන වර්ණනා කරයි.

යො හත්වාහිමරිණාත් සප්තසින්ධූන්
යො ගා උදාජදපධා වලස්‍ය
යො අශ්මනොරන්තරග්නිං ජජාන
සංවෘක්සමත්සු සජනාස ඉන්ද්‍රඃ[47]

තවදුරටත් මෙලෙස ඔහුගේ වීර වික්‍රමාන්විත ක්‍රියා සහ ඒවායින් ලෝවැස්සාට වූ සෙත ගැන සඳහන් වේ. ඉන්ද්‍ර යනු සාමාන්‍ය මනුෂ්‍ය රූපාකෘතිය ඉක්මවා ගිය කායික වශයෙන් විශාල වූ දෙවි කෙනෙකි. වෘතහන්, පුරින්ද ද, ශක්‍ර යනු මොහුට වූ පර්යාය නාමයෝය.

ඍග්වේදයේ ඉන්ද්‍ර හැරුණු විට දෙවියන් අතර ශ්‍රේෂ්ඨතමයා වරුණය. ඔහු වැනීම සඳහා ඍග්වේදයෙහි සූක්ත දොළසක් වෙන් කර ඇත. ධෘතවෘත, නීතිධාරක යනු මොහුටම වූ විශේෂයෝය.

ධීරා ත්වස්‍ය මහිනා ජානූංෂි
වි යස්තස්තම්භ රෝදසී විදූර්වී
ප්‍ර නාකමෘෂ්වං නුනුදෙ බෘහන්තං
ද්විතා නක්ෂත්‍රං පප්‍රථච්ච භූම[48] (vii 86, I)

යන උද්ධෘතයෙන් ඔහුගේ ස්වරූපය හා කායාභිහාරය පිළිබඳ ව දත හැකිය. සදාචාර පාලකයෙකු වශයෙන් අවශේෂ දෙවියන් අභිභවනය කළ වරුණ දිවා රෑ දෙක්හි ආලෝකාධිපතියාය.

න ස ස්වෝ දක්ෂො වරුණ ධ්‍රුතිඃ සා
සුරා මන්‍යුර්විභීදකො අචිත්තිඃ
අස්ති ජ්‍යායාන්කනීයස උපාරෙ
ස්වප්නශ්චනේදනෘතස්‍ය ප්‍රයෝතා[49] (vii 86 - vi)

යන උද්ධෘතයෙන් ද ඔහුගේ ස්වභාවය පිළිබඳ ව විස්තර වේ.

මෙලෙස අග්නි > ඉන්ද්‍ර > වරුණ යනාදි දෙවිවරුන් හැරුණු විට, සවිතෘ, මරුත, විෂ්ණු, ද්‍යාවා - පෘථිවි, රුද්‍ර, අපාංනපාත්, මිත්‍ර, බෘහස්පති, උෂස්, පර්ජන්‍ය, පූෂන්, මිත්‍රා-වරුණ, සූර්ය, අශ්විනා, සෝම, විශ්වදෙවා යනාදි දෙවිවරුන් පිළිබඳ ව ද සඳහන් වේ. ඒ අතර සවිතෘ පිළිබඳ ව සූක්ත 11කින් වර්ණිතය. වෙන් වෙන් වූ ගීත බොහොමයකින් ම ද සවිතෘ ගැන වර්ණනා කොට ඇත. ස්වර්ණාක්ෂි - ස්වර්ණහසත - ස්වර්ණජිවන යන ගුණවාචක ද ඔහුටම භාවිත ව ඇත. සවිතෘ යන්න සු පෙළඹවීමේ ධාතුවෙන් ව්‍යුත්පන්නය. මරුත හෙවත් සුළඟ ද දෙවියෙක් ලෙසින් සැළකූහ. සූක්ත 33කින් ඔහු ගැන වර්ණනා කෙරේ. ඒ හැරුණු විට ඉන්ද්‍ර දෙවිඳු සමග සූක්ත 07කින් ද අග්නි හා පූෂන් (VI 54) සමග සූක්ත 06කින් විෂ්ණු දෙවියන් ගැන හා ඔහුගේ ත්‍රිපද වික්‍රමය හා ළමයෙකුව නොසිට අතිවිශාල තරුණයෙකු වීම පිළිබඳ ව විස්තර වේ.

ද්‍යාවා - පෘථිවි = (අහස - පොළව) ඍග්වේදයෙහි දේව යුගලයක් ලෙස නම් කොට ඇත. සූක්ත 06කින් ඔවුන් ගැන වර්ණනා කෙරේ. ද්යෞස් කිසිම සූක්තයක තනිව අමතා නොමැත. පෘථිවි ද තනිව අමතා ඇත්තේ ගී තුනකින් යුත් එක සූක්තයක පමණි. ඍග්වේදයෙහි අප්‍රධාන තත්ත්වයක් හිමිවෙන රුද්‍ර ගැන සම්පූර්ණ සූක්ත තුනකත්, කොටස් වශයෙන් එකකත්, සෝම සමග අනුබද්ධ කොට එකකත් විස්තර වේ. මිත්‍ර හා වරුණ දෙවි, අතර පවත්නේ ඉතා කිට්ටු සම්බන්ධයකි. මිත්‍රදෙවි තනිව අමතනු ලබන්නේ එක් සූක්තයක පමණි. එහි දී පවා මිත්‍රගේ චරිතය පිළිබඳ ව තොරතුරු ලැබෙන්නේ අල්ප වශයෙනි. කෙසේ වුවත් වෛදික සාක්ෂිවලට අනුව මිත්‍ර සූර්ය දෙවියෙකු බව ඔප්පු වේ.

බ්‍රාහ්මණඃ පති හෙවත් යාච්ඤාවේ අධිපතියා ලෙස අමතන බෘහස්පති දෙවි වැනුමට සාකල්‍යයෙන් ම ඍග්හි සූක්ත 11ක් වෙන් කොට ඇත. තවත් සූක්ත 2කින් ඉන්ද්‍ර දෙවිඳු සමග වර්ණනා කෙරේ. ඔහුගේ භෞතික ලක්ෂණ සඳහන් වනුයේ මඳ වශයෙනි. දෙවියන්ගේ පියා ලෙසින් මොහු බුහුමනට ලක්ව ඇත.  දෙවියන් ගැන පමණක් නොව දෙවඟනන් පිළිබඳ කරන වැනුම් ද ඍග්වේදයෙහි හමුවේ. ඒ අතර උෂස් හෙවත් උසා දෙවඟන සූක්ත 20කින් පමණ මෙහි අමතනු ලැබේ.[50] උසස් හිරු සමග කිට්ටු සම්බන්ධකම් පවත්වන



බවත්, හිරුට ගමන් කිරීමට මං පෙත් හෙළිකරන්නේ උෂස් බවත් තත් සූක්තොක්ත පාඨ භාවයන්ගෙන් අනාවරණය වේ. වළාකුල යන අර්ථය දෙන පර්ජන්‍ය යනු ද ඍග්වේදයෙහි හමුවන දෙවිකෙනෙකි. මොහු පිළිබඳ තොරතුරු විරලය. ඒ නිසා ම ඍග්වේද දේව නිවහනේ මොහුට හිමිවන්නේ අප්‍රධාන තැනකි. මොහු පිළිබඳ ව වර්ණනාවට වෙන්වී ඇත්තේ ද සූක්ත 03ක් පමණි. විමුක්තිපුත්‍ර (විමුචො නපාත්) යන නමින් හැඳින්වෙන පූෂන් දෙවියා සූක්ත අටකින් මෙහි වර්ණිතය. ඉන් පහක් ම ඇත්තේ VII වන මණ්ඩලයෙහිය. මොහු පිළිබඳ ව ද තොරතුරු විරලය. ඔහු සියලු සත්ත්වයන් ගැන දන්නා සහ ඔවුන් දෙස බලාසිටින ආරක්ෂකයෙකු ලෙසින් සඳහන් වේ. ආපස් හෙවත් ජලය සූක්ත 04 කින් වර්ණනා කෙරේ. ඉන්ද්‍ර - අග්නි - සෝම යන්නවුන්ට පසුව අත්‍යන්තරයෙන්ම කැපී පෙනෙන දෙවිවරු නම් අශ්වීන්වරුන්ය.[51] මේ දෙදෙන පිළිබඳ ව සූක්ත 50 කටත් අධික ප්‍රමාණයක ද තවත් එක් එක් වෙන වෙන සූක්තවල ද තොරතුරු සංග්‍රහ වී ඇත. අශ්වීන් යනු අනන්‍යයෝය. තව ද මොවුන් රථාචාර්යයෝ දෙදෙනෙක් වශයෙන් ද ආකාශයේ දරුවෝ වශයෙන් ද සලකති.

සම්පූර්ණ සූක්ත 40කින් පමණ සියලු දෙවියෝ හෙවත් විශ්වේ දේවා ගැන වර්ණනා කෙරෙති.[52] සෑම දෙවිකෙනෙක් ම ඇතුළත් කොට වර්ණනා කිරීමට අදහස් කොට ඇති මෙහි විවරිත දෙවියෝ යාගය හා බැඳුණු කෘත්‍රි දේව කොටසකි. නමක් සඳහන් නොකොට ඒ ඒ දෙවියන්ට ආවේණික වූ ගුණාංග එක් එක් පද්‍යකින් විස්තර කෙරේ. කොටින්ම මේවා ප්‍රහේළිකා හෝ තෙරවිළි ස්වභාවයක් දරයි. ගී අනුපිළිවෙළට අනුව ඒ දෙවසමූහය නම් සෝම, අග්නි, ත්වෂ්ටෘ, ඉන්ද්‍ර, රුද්‍ර, පූෂන් විෂ්ණු අශ්වීන්වරුන්, මිත්‍ර - වරුණ හා අංගීරස් යන දෙවිවරුන්ය.

බභ්‍රුරෙකො විෂුණඃ සූනරො යුවාඤ්ජ්‍යංක්තෙ හිරණ්‍යයම් viii 29 - i
යොනිමේක ආ සසාද ද්යොතතොන් තර්දේවේෂු මේධිරඃ viii 29 - ii
වජ්‍රමේකෝ බිභර්ති හස්ත ආහිතං තෙන වෘත්‍රාණි ජිඝ්නතෙ viii 29 - iv
පථ ඒකඃ පීපාය තස්කරො යථාන් ඒෂ වේද නිධීනාම් viii 29 - vi[53]

සූක්ත 120කින් පමණ සෝම දේව වර්ණනය ද ඍග්වේදයෙහි සිදු කර ඇත. වැදගත්කම අතින් අග්නි දෙවියාට පමණක් මොහු දෙවැනි වේ.

ස්වාභාවික වස්තුවලට දේවත්වාරෝපණය (Deification) කිරීමට වේද යාදින්නා පෙළඹුණු බව ඍග්වේදානාගීත පූර්වෝක්ත සූක්තයන්ගෙන් පෙනේ. එහෙත් එයින් නොනැවතුණු ඔවුහු ඒ ඒ දේව වස්තු සතු විශේෂණ ලක්ෂණ ද දේවත්වයට නැගූ බව ඍග්වේදය නිරීක්ෂණයෙන් පෙනේ. සවිතා හා විවස්වත් යන නම් විභාගයෙන් තත් කරුණ මනාව වැටහේ.[54] සවිතා යනු සූර්යයාගේ උත්පාදක ශක්තිය හා ප්‍රාණවත් කිරීමේ බලයයි. විවස්වත් යනු එහි දිලිසෙන ස්වභාවයයි. මෙලෙස සූර්යදේව විශේෂණ නාම පර්යාය නාමවී පසුව වෙන් වෙන්ව දෙවියන් බවට පත් වූ අයුරු පැහැදිලි වේ. මේ හැරුණුවිට පූර්වෝක්ත මිත්‍ර - වරුණ - පූෂන් - උෂස් යන වචන ද ආදියෙහි සූර්යයාගේ ම විශේෂණ නාම වූ අතර, ඒවා ද පසුව දේවත්වයට පත් විය.

වෛදික ආර්යයන් මෙලෙස සොබාදහමේ බලවේගයන් වඳින්නට පුදන්නට වූයේ මිනිස් වර්ගයා පිළිබඳ ආදි යුගයේ ආකල්පවලින් ඈතට හිස ඔසවා නොතැබූ නිසාය. සොබාදහමේ අචින්ත්‍ය වූ ක්‍රියාකාරීත්වය දැකීමෙන් ආදි වෛදිකයා පුදුමයටත් බියටත් පත් විය. ඒ නිසා මිනිස් බලය ඉක්ම වූ බලයක් ශක්තියක් ඔවුනට ආරූඪ කළහ. තව ද ඔවුනට ප්‍රශස්ති භාෂණ පූර්වක යාචනයෙන් සම්පත් ලාභය ද එසේ නොකිරීමෙන් උවදුරු කම්කටොලු උද්ගතවෙන බව ද විශ්වාස කළහ. මේ නිසා ඔවුනගේ ගුණ ගායනා කිරීමට පෙළඹිණි. ඍග්වේදයේ X මණ්ඩලයේ 52 සූක්තයේ 06 වෙනි ගීතිකාවේ -

ත්‍රීණිශතා ත්‍රිසහස්‍රාණ්‍යග්නිං
ත්‍රිංශච්චදෙවා නවචාසපර්යන්
ඖක්ෂන්ඝෘතෛරස්තෘණන් බර්හිරස්මා
ආදිද්ධොතාරං න්‍යසාදයන්ත

යනුවෙන් දෙවිවරු 3339 පිළිබඳ සඳහන් වේ. මේ අනුව ප්‍රාරම්භයේ දී දෙවිවරු අල්ප වුව කල්ගතවීමේ දී ක්‍රමිකව විකාශය වී දේවපරම්පරාවක සම්භවය සිදුවන බව පෙනේ. ද්‍යාවා - පෘථිවි - අදිති - මිත්‍ර - වරුණ - ධාතෘ - අයර්මා - අංශභග - විවස්වත් - සවිතා - පූෂා - විෂ්ණු - ඉන්ද්‍ර - අග්නි - ද්‍යෞඃ - උෂා - රුද්‍ර - වායු - යම - පුරුෂ - විශ්වකර්මා - අශ්වින් - පර්ජන්‍ය ආදි දේව නාම මෙහිලා නිදර්ශනයෝය.[55] මෙලෙස බොහෝ දෙවියන් පිළිබඳ



ආකල්පය එනම් - බහුදේවවාදය (polytheism) ඍග්වේදයෙහි ක්‍රමිකව හැදී වැඩී ස්ථාපිත වූ අයුරු පෙනේ.

ඍග්වේදයේ දෙවිවරුන් ගණන 33ක් වන බව ද සඳහන් වේ. ඒ සියල්ලෝ වෛදික ආර්යාගේ පූජාවට පාත්‍රවූවෝ වෙති. ආදි කාලීන ග්‍රීකයන්ට මෙන්ම වෛදිකයන්ට ද ලෝක තුනක් වූහ. එනම්:- පෘථිවියත්, වායුගෝලයත්, අහසත්ය. ඍග්වේද දෙවියෝ මේතුන් ලොවෙහිම විසූහ. දිව් යනු අහසයි. දේව යනු අහසෙහි ඉන්නා යනුයි. වෛදික ආර්යා පිදූ දෙවියන් මේ අනුව ස්වර්ගස්ථ (situated in the heaven) භූමස්ථ (situated in the earth) හා අන්තරීක්ෂස්ථ (situated in the sky) යනුවෙන් වර්ග කළ හැකිය. ද්‍යෞස් වරුණ මිත්‍ර ආදිත්‍ය සූර්ය සවිතෘ පූෂනි විෂ්ණු අශ්වින් උෂස් රාත්‍රී යන මොවුහු ස්වර්ගස්ථ දේවතාවෝ වෙති. පෘථිවි අග්නි බෘහස්පති සෝම යන මොවුහු භූම්‍යස්ථ (භූමස්ථ) දේවතාවෝය. ස්වර්ගයටත් පෘථිවියටත් අතර පිහිටි වායුගෝලය අන්තරීක්ෂ නම් වේ. ඉන්ද්‍ර - රුද්‍ර - මරුත් - වායු - අපාංනපත් - පර්ජන්‍ය - ආප් යන මොවුහු අන්තරීක්ෂස්ථ දෙවිවරුය.[56] පූර්වෝක්ත සකල දේව සමූහයාගේ ම ආහාරය වූයේ ගිතෙල්, ධාන්‍ය හා මාංසාහාරය වැනි මනුෂ්‍ය ආහාරමය. සෝම පැලෑටියෙන් ගත් යූෂයෙන් පෙරාගත් සෝමපානය දෙවියන්ගේ ප්‍රියතම පානය විය. අග්නි, අයර්මන්, සවිතෘ ඉන්ද්‍ර, මිත්‍ර, පූෂන්, විෂ්ණු, බෘහස්පති, පර්ජන්‍ය, සූර්ය, වරුණ හා අශ්වින් දෙදෙනා පිරිමි දෙවියෝය. උෂස් සරස්වතී, වාච්, රාත්‍රී, පෘථිවි, ඉන්ද්‍රාණී, වරුණානී හා ආරණ්‍යානී යන මොවුන් ස්ත්‍රී දේවතාවෝය.[57] ආපස් මරුත් ආදිත්‍ය අප්සරස් දේවගණ හෙවත් රාශී දේවතාවෝ නම් වෙති. අශ්වින්, මිත්‍ර - වරුණ, ද්‍යාවා - පෘථිවි යුග්ම දේවතාවෝය. අසුර - දාස - දස්‍යු - වෘත්‍ර - වල - දනව - විශ්වරූප - ස්වර්භානු - දෙවියන්ට විරුද්ධ රාක්ෂසයෝය. යම - යමී නම් නිඹුලු සොහොයුරු සොහෝයුරියන් දෙදෙනා මිනිස් වර්ගයාගේ මුල් මව්පිය දෙදෙනාය. මෙලෙස දේව පරම්පරාවක උප්පත්තිය ඍග්වේදයෙහි ප්‍රාරම්භක අවධියෙහි දැකිය හැකිය. පශ්චාත් කාලීනව ගංගාවෝ ද දේවත්වයට නැගුහ. සින්ධු - විපාශ් - ශුත්‍රුද්‍රී සරස්වතී යන ගංගාවෝ ද භූම්‍යස්ථ දේවගණයෙහිලා සැලකේ. මේ හැරුණු විට ශ්‍රද්ධා - මන්‍යු - භග - අදිති ආදි ගුණ නාමයන්ට ද දේවත්වාරෝපණය කර ඇත. පසුකාලීනව ඍග්වේද සූක්ත රචනා කළ ඍෂිවරු ද දේවත්වයට

නඟා ඇත. වේදකර්තෘවරු පමණක් නොව කල් යාමේ දී යාගහෝමාදියට ගන්නා භාණ්ඩවලට ද දේවත්වය ආරෝපණය කර ඇත. මේ අනුව බොහෝ දෙවියන් පිළිබඳ ව විශ්වාසය හෙවත් බහු දේවවාදය ඍග්වේදයෙහි පළමුව පැණෙන සුවිශේෂ වූ අවස්ථාවක් වූ බව පෙනේ.

මෙලෙස බොහෝ දෙවියන් පිළිබඳ විශ්වාස අසුන මත වෛදික ආර්යයා තම ආගම ගොඩනඟයි. එහෙත් කල්යත්ම ස්වාභාවිකව ඇතිවෙන චින්තනයේ පරිණාමයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුහු බහුදේව ඇදහිල්ලෙන් මිදී එක් දෙවියෙකු පිළිබඳ ව සිතන්නට පෙළැඹෙති. එනම් ඒකදේවවාදයේ (Monotheism) සම්භවයයි. එහි දී ඉන්ද්‍ර - වරුණ - අග්නි ආදි දෙවිවරුන් මෙලෙස කලින් කලට ඒක දේවවාදී පුදසුනේ කිරුළ හිමිකර ගත්හ. එහෙත් භක්තිමත් යදින්නාගේ චිත්ත විපර්යාසය මත වෙනත් දෙවිවරුන්ට ද සියලු සෙසු දෙවියන් අතර ප්‍රධාන ස්ථානය හිමිකර දී ඇත. ඉන්ද්‍ර වරුණාදි දෙවිවරුන් සතු නිශ්චිත ගුණාංග පිළිබඳ අවධානයක් මෙකළ නොපැවැතිණි. තම සිතැඟි චේෂ්ටාවන් මස්තක ප්‍රාප්ත කරගැනීමෙහිලා තමාට හැකි අයුරින් දෙවියාගේ ගුණ ගායනයට මෙකළ යාදින්නා පෙළඹුණහ.

වෛදික යුගයේ බෙහෙවින් ජනප්‍රියවූ ජාතික දෙවියා වූයේ ඉන්ද්‍රය. අග්නි දෙවියා යාදින්නාට වඩාත් සමීපතම වූ දෙවියාය. ඍතයට අධිපති හෙවත් සදාචාරයෙහි නියමුවා වූයේ වරුණ දෙවිඳුය. මෙලෙස ඒ ඒ දෙවියන් ඒ ඒ අංශයන් අතරත ප්‍රධාන තැන හෙබවූහ. එය ආවස්ථික ඒකදෙව වාදය (Henotheism) නම් වේ.

කල්යත්ම විශාල දේවපරපුරකට කරන පුද සත්කාරවලින් හෙම්බත්ව වෙහෙස වී සිටි පුදන්නා සර්වව්‍යාපී සර්වඥවූ අධිකාරී බලයක් ඇති එකම අසහාය දෙවියෙකු ස්වසුබවිහරණය සඳහා ඇතිකරගත්හ. සර්වව්‍යාපී ශ්වරවාදය (Pantheism) නම් මෙයයි. බලය ප්‍රතාපය දයා දාක්ෂිණ්‍ය ප්‍රඥාව සෑම වෛදික දෙවියෙකුටම සාධාරණ ලක්ෂණයෝය. එහෙත් ඒ අතරත සුවිශේෂී ගුණෝපලක්ෂිත දෙවිවරු ද වූහ. විශ්වකර්මන් - පුරුෂ - ප්‍රජාපති - බ්‍රහමන් යන දෙවිවරු මෙහිලා නිදර්ශනයෝය. සදාකාලික වූ සර්වබලධාරී අන්‍ය සියලු දෙවියන්ට අධිපති වූ ශ්‍රේෂ්ඨ දෙවියෙකු වශයෙන් ද සෙසු දෙවියන්



මොවුන්ගේ ඡායා මාත්‍ර වශයෙන් ද සැලකූහ. එහෙත් කලින් කලට ප්‍රධාන දේව අසුනෙහි උරුමය වෙනස් විය.

මේ අනුව සමස්ත දේව සම්භවය හා විකාශය හකුළුවා පියවර හතරක් යටතේ මෙලෙස පෙළගැස්විය හැකිය.

(1) බහුදේව වාදය (Polytheism)
(2) ආවස්ථික ඒක දේවවාදය (Henotheism)
(3) ඒකදේව වාදය (Monotheism)
(4) සර්වව්‍යාපී ශ්වරවාදය (Pantheism)

යනුවෙනි.

මෙලෙස ඍග්වේදයේ දේවකථාවන්ගේ ආරම්භය හා ක්‍රමික විකාශය වූ අයුරු සවිස්තරව ඇතුළත් වේ. කෙසේ වෙතත් ඉන්ද්‍ර වරුණ මිත්‍ර ආදි දෙවිවරුන්ගේ තේජස කල් යත්ම දියවී ඒ වෙනුවට විෂ්ණු, රුද්‍ර (ශිව), බ්‍රහ්ම යන දෙවියෝ කරළියට පැමිණේ. අද්‍යතනයේ ද ත්‍රිමූර්තිය නමින් ඔවුන්ට භක්ති පූජෝපහාර දක්වති.

ඍග්වේදයේ X මණ්ඩලයේ 129 සූක්තය විශ්වසම්භවය පිළිබඳ තොරතුරු හෙළිදරව් කරන්නකි. විශ්ව සම්භවය යනු අසත් සත් බවට පරිණාමය වීමක් ලෙස විස්තර කෙරේ. එනම්:- නස්තිත්වය (අසත්තත්වය) අස්තිත්වයට සත්ත්වයට පත්වීමයි.

නාසදාසීන්නො සදාසීත්තදානීං
නාසීද්‍රජෝ නො ව්‍යෝමා පරෝ යත්
කිමාවරිවඃ කුහ කස්‍ය ශර්මන්ත්
අම්භඃ කිමාසීද් ගහනං ගභීරම්[58] (x, 129 - i)

(එකල්හි නැති බව නොවීය. ඇති බව නොවීය. වාතය නොවීය. යම් අනන්ත අවකාශය නොවීය. වාතය නොවුනු අතර, කුමක් අඩංගු වී ද? කොහේ කාගේ ආරක්‍ෂාවක් ද? කියනු කිම? මිනිය නොහැකි ගැඹුරු ජලස්කන්ධය වී ද?)

යනාදි පරිදි මුලින් සෑම තැනම ජලය පැතිර තිබුණු බව සඳහන් වේ.

තම ආසීත්තමසා ගුළ්හමග්‍රෙ
ප්‍රකෙතං සලිලං සර්වමා ඉදම්
තුච්ඡ්‍යෙනාභවපිහිතං යදාසීත්
තපසස්තන්මහිනාජායතෛකම්[59] (x, 129 - i)

කාමස්තදග්‍රෙසමවර්තතාධි
මනාසො රෙතඃ ප්‍රථමං යදාසීත්
සතෙ බන්ධුමසති නිරවින්දන්
හෘදි ප්‍රතීෂ්‍යා කවයො මනීෂා[60] (x, 129 - i)

සත්භාවයට යන යමක් ශූන්‍යත්වයෙන් වැසුණේ ද ඒ එකම සත්භාවය බලවත් තාපයෙන් උපන්නේය. මුනිවරු ප්‍රඥාවෙන් සිය ප්‍රඥාවෙන් සිය හදවතෙහි සොයා බලා අසත්භාවය තුළ සත්භාවයාගේ බන්ධනය සොයා ගත්හ. - යනාදි පරිදි ක්‍රමිකව සිදුවූ ලෝකොත්පත්ති වෘත්තාන්තය ගැන විස්තර වේ. පශ්චාත්කාලීනව විකසිත වූ සාංඛ්‍යදර්ශනයෙහි ඉගැන්වීම් ද මේ පුවත සමග සැසැඳේ. මේ අනුව ඍග්වේදයේ පසුකාලීන විකසිත දර්ශනයන්හි මුල්බීජ ව්‍යාප්ත ව පවතින බව පෙනේ. මේ හැරුණු විට x - 90 - 12 ගීය පශ්චාත්කාලීන සමාජයෙහි මුල් බැසගත් චතුර්වර්ණය පිළිබඳ ව ද දත්ත සපයයි. ඒ අනුව,

බ්‍රාහ්මණෝ’ස්‍ය මුඛමාසීද්
බාහුරාජන්‍යඃ කෘතඃ
ඌරූ තදස්‍ය යද්වෛශ්‍යඃ
පද්භ්‍යාං ශූද්‍රෝ අජායත[61] (X - 90 - 12)

ඔහුගේ (බ්‍රහ්මයාගේ) කට බමුණාගේ (උපන්තැන) විය. බාහු යුගලය ක්ෂත්‍රියයා නිමවීය. යම් වෛශ්‍යයෙක් වී ද ඒ ඔහුගේ වටොර යුගලයි. ශූද්‍රයා දෙපතුළින් උපන්නේය. - 10 වැනි මණ්ඩලය පශ්චාත්කාලීන එකතුවක් වශයෙන් සලකයි. ඒ අනුව බමුණන් විසින් ස්ව ආධිපත්‍ය සමාජය තුළ ස්ථාපිත කිරීමට මෙම ගීය ඇතුළත් කරන්නට ඇතැයි සැක පහළ කරති. ඍග්වේදයේ වෙන කිසිදු මණ්ඩලයක මෙබඳු සඳහනක් නොමැති වීම ද මෙහි දී අවධානය යොමු කළ යුක්තකි.

10 මණ්ඩලයේ පුරුෂ සූක්තය ද එම මණ්ඩලයෙහිම 34 වැනි සූක්තය සූදුකාරයාගේ ගීතය දක්වේ. එහිම 127 වෙනි සූක්තය රාත්‍රී නම් දෙවඟන පිළිබඳ වැනුමට ද 135 වෙනි සූක්තය යම පිළිබඳ ව තොරතුරු කථනයට ද වෙන් වී ඇත. ඍග්වේදයේ 10 වෙනි මණ්ඩලයේ 14 වෙනි සූක්තය මළගම පිළිබඳ ව විස්තර කරන අතර, තත් මණ්ඩලයේ ම යම හා යමී අතර ඇතිවෙන සංවාදය ද අන්තර්ගතව ඇත. එය පසුව සකු සාහිත්‍ය ලතාවෙහි හටගත් සුපෝෂිත දෘශ්‍ය කාව්‍ය ඵලයෙහි මුල් අවස්ථාව හෙළිදරව් කරන්නකි. X - 85 දීර්ඝ විවාහ ගීතයකි. X 14, 15, 16, 17, 18 යන සූක්ත පස ආදාහන මතක ගීතයෝය. X - 95 පුරූරවස් රජුගේ හා ඌර්වස් අප්සරාවගේ දෙබස වර්ණිනා වේ. පසුකාලයේ දී මෙය කාලිදාසගේ වික්‍රමෝර්වශී නම් නාට්‍ය ග්‍රන්ථයට හේතු විය. උපදේශාත්මක ස්වරූපී සූක්ත ද හමුවේ x 84 සූක්තය සූදුවෙන් පැරැදුණු අයෙකුගේ දුක්මුසු විලාපය සහිත ගී එබඳු උපදේශ අන්තර්ගත අවස්ථාවකි.[62] මෙබඳු උපදේශ අන්තර්ගත අවස්ථා 04 ක් ගැන සඳහන් වේ. x 112 සූක්තයෙන් මිනිසුන් ලාභ ලබන ක්‍රම ගැන කියැවේ. ix 71 වෙනි සූක්තයෙන් බුද්ධිමත් කථාවේ අගය කියවෙන අතර x, 117 සූක්තයෙන් පුණ්‍යකර්මීයන්ගේ අගය අගය කෙරේ. ඍග්වේදයෙහි viii 29, සහ i 64 යන ගීත ප්‍රහෙළිකා ස්වරූපයෙන් යුක්තය.



**ආන්තික සටහන්:**


1. අස්සජි හිමි, අඹකුඹුරේ, හිරිමාන්න, ප්‍රේමසිරි, (1962) සාධනා දෙවන කලාපය, 31 පි.
2. එම, 32 පි.
3. එම, 31 පි.
4. පැට්රික්, නාරාවිල, (1997) ඍග්වේදගීතාවලී, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, ix පි.
5. එම, 31 පි.
6. හිරියන්න, ඇම්., (1970) සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 39 පි.
7. එම, 39 පි.
8. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 7 පි.
9. එම, 9 පි.
10. හිරියන්න, ඇම්., (1970) සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 40 පි.
11. තිලකසිරි, ජේ., (1988) වෛදික සාහිත්‍යය, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1 පි.
12. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 10පි.
13. එම, 10 පි.
14. අස්සජි හිමි, අඹකුඹුරේ, හිරිමාන්න, ප්‍රේමසිරි, (1962) සාධනා දෙවන කලාපය, 32 පි.

15. තිලකසිරි, ජේ., (1988) වෛදික සාහිත්‍යය, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1 පි.
16. හිරියන්න, ඇම් ., (1970) සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 121 පි.
17. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 07 පි.
18. අස්සජි හිමි, අඹකුඹුරේ, හිරිමාන්න, ප්‍රේමසිරි, (1962) සාධනා දෙවන කලාපය, 32 පි.
19. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 10 පි.
20. සේනානායක, ජී. එස්. බී., (1960) සංස්කෘත සාහිත්‍යය, ඇම්. ඩී. ගුණසේන සහ සාමගම, 11 පි.
21. එම, 12 පි.
22. අස්සජි හිමි, අඹකුඹුරේ, හිරිමාන්න, ප්‍රේමසිරි, (1962) සාධනා දෙවන කලාපය, 33 පි.
23. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 10 පි.
24. එම, 10 පි.
25. අස්සජි හිමි, අඹකුඹුරේ, හිරිමාන්න, ප්‍රේමසිරි, (1962) සාධනා දෙවන කලාපය, 33 පි.
26. තිලකසිරි, ජේ., (1988) වෛදික සාහිත්‍යය, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2 පි.
27. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 7-10 පි.
28. හිරියන්න, ඇම්., (1970) සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 43 පි.
29. අස්සජි හිමි, අඹකුඹුරේ, හිරිමාන්න, ප්‍රේමසිරි, (1962) සාධනා දෙවන කලාපය, 32 පි.
30. තිලකසිරි, ජේ., (1988) වෛදික සාහිත්‍යය, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2 පි.
31. සේනානායක, ජී. එස්. බී., (1960) සංස්කෘත සාහිත්‍යය, ඇම්. ඩී. ගුණසේන සහ සාමගම, 14 පි.
32. පැට්රික්, නාරාවිල, (1997) ඍග්වේදගීතාවලී, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1 පි.
33. හිරියන්න, ඇම්., (1970) සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 44 පි.
34. පැට්රික්, නාරාවිල, (1997) ඍග්වේදගීතාවලී, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, Xii-Xiii පි.
35. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 10 පි.



36. සේනානායක, ජී. එස්. බී., (1960) සංස්කෘත සාහිත්‍යය, ඇම්. ඩී. ගුණසේන සහ සාමගම, 14-15 පි.
37. එම, 15 පි.
38. එම, 13 පි.
39. තිලකසිරි, ජේ., (1988) වෛදික සාහිත්‍යය, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 3 පි.
40. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 10 පි.
41. පැට්රික්, නාරාවිල, (1997) ඍග්වේදගීතාවලී, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 05 පි.
42. එම, 09 පි.
43. එම, ප්‍රස්තාවනාව
44. එම, 14 පි.
45. එම, 63 පි.
46. එම, 64 පි.
47. එම, 65 පි.
48. එම, 191 පි.
49. එම, 196 පි.
50. එම, 129 පි.
51. එම, 181 පි.
52. එම, 209 පි
53. එම, 209 පි.
54. තිලකසිරි, ජේ., (1988) වෛදික සාහිත්‍යය, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 4 පි.
55. සේනානායක, ජී. එස්. බී., (1960) සංස්කෘත සාහිත්‍යය, ඇම්. ඩී. ගුණසේන සහ සාමගම, 22-26 පි.
56. අස්සජි හිමි, අඹකුඹුරේ, හිරිමාන්න, ප්‍රේමසිරි, (1962) සාධනා දෙවන කලාපය, 35 පි.
57. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තේ, (1952) සංස්කෘත ග්‍රන්ථවංශය, අම්බලංගොඩ, විජය මුද්‍රණාලය, 10 පි.
58. පැට්රික්, නාරාවිල, (1997) ඍග්වේදගීතාවලී, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 293 පි.
59. එම, 294 පි.
60. එම, 295 පි.
61. එම, 284 පි.
62. එම, 363 පි.